# ජනපතිවරණ වැරැදි 62ක් ගැන පැමිණිලි

## ● රාජ්‍ය දේපළ හා බලය අවභාවිත කිරීම් ගැන පැෆරල් අවධානයෙන්

මව්බිම

නුවන් හෙට්ටිආරච්චි

ජනපතිවරණය ප්‍රකාශයට පත්කර තිබියදී රාජ්‍ය දේපළ හා බලය අවභාවිත කිරීම සම්බන්ධව පැමිණිලි 62ක් මේ වන විට පැෆරල් සංවිධානයට වාර්තා වී ඇති බව එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි පවසයි.

ඊයේ (15දා) මරදාන සමාජ හා සාමයික කේන්ද්‍රයේ පැවැති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව පැවැසීය.

ඊට අමතරව රාජ්‍ය නිලධාරීන් පත්කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, දේශපාලන කටයුතුවල යෙදවීම් හා නීති විරෝධී ප්‍රචාරණ කටයුතු පිළිබඳවද සාක්ෂි සහිතව තොරතුරු ලැබී ඇති බවත් ඒ පිළිබඳව නිරීක්ෂණය කිරීමට පැෆරල් සංවිධානය පැමිණිලි ඒකකයක් පිහිටුවා ඇති බවත් සඳහන් කරන හෙට්ටිආරච්චි මහතා සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි පහත දැක්වෙන දුරකථන අංක අමතිය හැකි බවද සඳහන් කරයි.

බස්නාහිර පළාත - 070 - 4701141
මධ්‍යම පළාත - 070-4701142
වයඹ පළාත - 070-4701143
සබරගමු පළාත - 070-4701144
උතුරු මැද පළාත - 070-4701145
දකුණු පළාත - 070-4701146
ඌව පළාත - 070-4701147
උතුර - නැගෙනහිර පළාත - 070-4701148

එම පැමිණිලි විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් වැඩිදුර පියවර ගැනීමට පළපුරුදු නීතිඥයන් 26කින් යුතු කාර්ය මණ්ඩලයක් පත්කර ඇති බවත් හෙතෙම පැවැසීය.